ශ්‍රී ලංකා

# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

# 1997 අංක 25 දරන ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතන පනත

[සහතිකය සටහන් කළේ 1997 ඔක්තෝබර් මස 06 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1997 ඔක්තෝබර් මස 10 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 10.25 යි. තැපැල් ගාස්තුව : 4.60 යි.

# 1997 අංක 25 දරන
# ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතන පනත

[සහතිකය සටහන් කළේ 1997 ඔක්තෝබර් මස 06 වන දින]

එල්. ඩී.–ඕ. 57/95

**ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයක් පිහිටුවීම සඳහා ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

1. මේ පනත 1997 අංක 25 දරන ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතන පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නියම කරනු ලබන (මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය. ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.

## I වන කොටස

## ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය පිහිටුවීම.

2. (1) මේ පනතේ විධිවිධානවලට අනුකූලව (මෙහි මින් මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය නමි වූ ආයතනයක් පිහිටුවනු ලැබිය යුතු ය. ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය පිහිටුවීම.

(2) ආයතනය, (1) වන උපවගන්තියෙන් ඊට දී ඇති නාමයෙන්, අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු අතර, ඒ නාමයෙන් ආයතනය විසින් ද ආයතනයට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි ය.

3. ආයතනයේ කර්තව්‍ය පහත දක්වෙන පරිදි වන්නේ ය :- ආයතනයේ කර්තව්‍ය.

(අ) බරවාහන ඇතුළු සියලු වර්ගවල මෝටර් වාහන පදවන හෝ ධාවනය කරන රියැදුරන්ට සහ ධාවකයන්ට වෛද්‍ය සේවා සහ ආධාර සැලසීම ;

(ආ) බරවාහන ඇතුළු සියලු වර්ගවල මෝටර් වාහනවල රියැදුරන් හා ධාවකයන් පරීක්ෂා කර ඒ රියැදුරන්ට හා ධාවකයන්ට ශාරීරික හා මානසික යෝග්‍යතාව පිළිබඳ සහතික ලබා දීම ;

(ඇ) බරවාහන ඇතුළු සියලු වර්ගවල වාහනවල රියැදුරන් හා ධාවකයන් වෛද්‍ය පරීක්ෂණවලට භාජනය කර, ඔවුන්ගේ සුදුසුකම සහ යෝග්‍යතාව පිළිබඳ නිර්දේශ ලබා දීම ;

2–ඩී 042643–5,900 (96/12)

(ඇ) කවර හෝ වර්ගයක මෝටර් වාහනවලට අදාළ අනතුරු හා සම්බන්ධ අවස්ථාවල දී වෛද්‍ය සේවා සහ ආධාර සැලසීම ;

(ඉ) සියලු විස්තරවලට අයත් මෝටර් වාහන, ශාරීරිකව හා මානසික යෝග්‍ය හා ප්‍රවීණ තැනැත්තන් විසින් පමණක් ධාවනය කරනු ලබන හෝ පදවනු ලබන බවට, ආයතනය විසින් ම හෝ වෙනත් නියෝජ්‍යායතන විමසා හෝ, වගබලා ගැනීම ;

(ඊ) ආයතනයේ කර්තව්‍ය ඉටු කිරීමේ කාර්යය සඳහා විවිධ දිස්ත්‍රික්කවලට හා පළාත්වලට සුදුසු වෛද්‍ය නිලධරයන්ගේ මණ්ඩලයක් පත් කිරීම ;

(උ) කාර්මික ස්වස්ථතාව සහ කාර්මික අනතුරු පිළිබඳව වෛද්‍ය උපදෙස් හා නිර්දේශ ලබා දීම ;

(ඌ) අනතුරු අවස්ථා සම්බන්ධයෙන් ගෙවිය යුතු වන්දි හෝ අලාභ ප්‍රමාණය පිළිබඳ උපදෙස් හා විශේෂ ගුරු උපදේශ ලබා දීම ;

(එ) අදාළ ක්‍රියාත්මක කිරීමේ බලධරයන් විසින් පිළිගත යුතු හා ක්‍රියාත්මක කළ යුතු, ප්‍රවාහන වෛද්‍ය කටයුතුවල ප්‍රමිති සකස් කිරීම හා සීමා නියම කිරීම ; සහ

(ඒ) 1987 අංක 23 දරන රාජ්‍ය සංස්ථා හෝ ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනත යටතේ පිහිටුවන ලද සමාගම්වල, හෝ රාජ්‍ය සංස්ථාවල හෝ 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත යටතේ ලියාපදිංචි වූ පෞද්ගලික බස්රථ සමාගම්වල සේවයේ නියුක්ත රියැදුරන්ට හා ධාවකයන්ට වෛද්‍ය සේවා සහ ආධාර ලබා දීම.

ආයතනයේ කර්තව්‍ය.

4. ආයතනයේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය බලතල ආයතනය සතුවන අතර, විශේෂයෙන්ම පහත සඳහන් සියලු දේවල් හෝ ඉන් කිසිවක් හෝ කිරීමේ බලය ද ආයතනය සතු වන්නේ ය :–

(අ) යම් චංචල හෝ නිශ්චල දේපළක් (විකිණීමෙන්, ත්‍යාග කිරීමෙන් හෝ අන්‍යාකාරයකින්) අත්කර ගැනීම, දැරීම, බද්දට හෝ කුලියට ගැනීම හෝ දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම සහ විකිණීම හෝ අන්‍යාකාරයෙන් නියාදනය කිරීම ;

(ආ) යම් බැංකුවක හෝ බැංකුවල ජංගම, ඉතිරි කිරීමේ හෝ තැන්පතු ගිණුම් විවෘත කිරීම හා පවත්වාගෙන යාම ;

(ඇ) ශ්‍රී ලංකාවේ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත තැනැත්තන්ගෙන් හෝ පුද්ගල මණ්ඩලවලින් ප්‍රදාන හෝ පරිත්‍යාග භාර ගැනීම ;

(ඈ) ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමෙහි ලා හෝ කර්තව්‍ය ඉටු කිරීමෙහි ලා අවශ්‍ය සියලු ගිවිසුම්වලට ඇතුළත්වීම සහ ඒ ගිවිසුම් ඉටු කිරීම ;

(ඉ) යම් ප්‍රයෝජනයට නොගත් ආදායමක් ද ඇතුළුව ආයතනයට අයත් මුදල් යම් සුරැකුමක ආයෝජනය කිරීම හෝ එවැනි යම් මුදලක් ශ්‍රී ලංකාව තුළ යම් නිශ්චල දේපළක් මිල දී ගැනීම සඳහා ආයෝජනය කිරීම හෝ එම ආයෝජන වෙනස් කිරීම හෝ ඒ මුදල්වලින් වහා වියදම් කිරීම සඳහා අවශ්‍ය නොවන කොටසක් යම් බැංකුවක ස්ථිර තැන්පතු වශයෙන් තැබීම ;

(ඊ) ස්වකීය කර්තව්‍ය ඉටු කිරීමේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි මුදල් ප්‍රමාණයන් ණයට ගැනීම ;

(උ) ආයතනයේ අරමුණුවලට සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් සමාන වූ අරමුණු සහිතව, ශ්‍රී ලංකාව තුළ හෝ විදේශයක පිහිටි වෛද්‍ය සහ වෙනත් ආයතන සමග, පුද්ගලයන් හුවමාරු කිරීම සහ පුහුණු කිරීම සඳහා ද, පර්යේෂණ සහ උපදේශක සේවා සඳහා ද, සාමාන්‍යයෙන් ස්වකීය පොදු අරමුණු ඉටු කර ගැනීමේ කාර්ය සඳහා ද සහයෝගයෙන් ක්‍රියා කිරීමේ ගිවිසුම්වලට ඇතුළත් වීම ;

(ඌ) මේ පනත යටතේ ආයතනයේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය නිලධරයන් හෝ සේවකයන් පත් කිරීම, සේවයේ නියුක්ත කිරීම, ඔවුන්ට පාරිශ්‍රමික ගෙවීම, ඔවුන්ගේ විනය පාලනය කිරීම සහ ඔවුන් සේවයෙන් පහකිරීම ;

(එ) ආයතනය මගින් සලසනු ලබන සේවා සහ ආධාර සඳහා ගාස්තු අයකිරීම ;

(ඒ) රීති සෑදීම සඳහා මේ පනත මගින් නියමිත සියලු කරුණු සම්බන්ධයෙන් රීති සෑදීම ; සහ

(ඔ) ආයතනයේ මතය අනුව එහි කර්තව්‍ය ඉටු කිරීම පහසු කරවීමට අවශ්‍ය වෙනත් සියලු දේ කිරීම.

## II වන කොටස

### මණ්ඩලයේ සංයුතිය

ආයතනයේ පරිපාලනය මණ්ඩලය වෙත පවරනු ලැබිය යුතු බව.

5. (1) ආයතනයේ කටයුතු පිළිබඳ පරිපාලනය, කළමනාකරණය සහ පාලනය (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පවරනු ලැබිය යුතු ය.

(2) ආයතනයේ කටයුතු පරිපාලනය කිරීමේ කාර්යය සඳහා මණ්ඩලය විසින් මේ පනතින් ආයතනයට පවරනු ලබන, නියම කරනු ලබන හෝ බාර කරනු ලබන බලතල, කර්තව්‍ය හා කාර්ය ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය ; නැතහොත් ඉටු කරනු ලැබිය යුතු ය.

මණ්ඩලයේ සංයුතිය.

6. (1) මණ්ඩලය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය ;

(අ) නිල බලයෙන් පත්වන සාමාජිකයන් පස් දෙනෙක්, එනම් :-

(i) ප්‍රවාහන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයා ;

(ii) 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත මගින් පිහිටුවන ලද ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ සභාපතිවරයා හෝ ඔහුගේ නියෝජිතයා ;

(iii) නියෝජ්‍ය පොලිස්පති (රථවාහන) හෝ ඔහුගේ නියෝජිතයා ;

(iv) සෞඛ්‍ය විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයා ; සහ

(v) මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයා ;

(ආ) ගමනාගමන හෝ වෛද්‍ය ක්ෂේත්‍රවල පළපුරුද්ද ඇති හෝ සුදුසුකම් ඇති හෝ හැකියාව පෙන්නුම් කර ඇති තැනැත්තන් අතුරින් තෝරා ගෙන අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන (මෙහි මින් මතු "පත්කළ සාමාජිකයෝ" යනුවෙන් සඳහන් කරනු ලබන) සාමාජිකයන් හතර දෙනෙක්.

(2) අමාත්‍යවරයා විසින් මණ්ඩලයේ සභාපතිවරයා ලෙස මණ්ඩලයේ එක් සාමාජිකයකු පත් කරනු ලැබිය යුතු ය.

(3) සභාපතිවරයා, ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු ය.

(4) යම් තැනැත්තෙක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ පළාත් සභා මන්ත්‍රීවරයකු වේ නම් හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ පළාත් සභා මන්ත්‍රීවරයකු වුවහොත් හෝ ඒ තැනැත්තා මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ එසේ කටයුතු කරගෙන යාමට නුසුදුස්සෙක් වන්නේ ය.

7. (1) මණ්ඩලයේ පත් කළ සාමාජිකයකු සිය පත්වීමේ දින සිට අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුතු ය. ධුර කාලය.

(2) මණ්ඩලයේ යම් පත්කළ සාමාජිකයකු අමාත්‍යවරයා විසින් කිසිදු හේතුවක් නොදක්වා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය. මණ්ඩලයේ යම් සාමාජිකයකු ඉවත් කිරීම කිසිම අධිකරණයක දී ප්‍රශ්නයට භාජන නොකළ යුතු ය.

(3) මණ්ඩලයේ පත් කළ සාමාජිකයකු විසින් අමාත්‍යවරයා වෙත යවනු ලබන ලිපියක් මගින් ඕනෑම අවස්ථාවක තම ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(4) මියයාමෙන්, ඉල්ලා අස්වීමෙන්, ධුරයෙන් ඉවත් කරනු ලැබීමෙන් හෝ අන්‍යාකාරයකින් යම් පත් කළ සාමාජිකයකු ධුරය හිස් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් මණ්ඩලයේ සාමාජිකත්වයේ පුරප්පාඩුවක් ඇති වූ විට එම පුරප්පාඩුව පිරවීම සඳහා 6 වන වගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගෙන වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය යුතු ය.

(5) පත් කළ සාමාජිකයකු මියයෑමෙන්, ඉල්ලා අස්වීමෙන්, ධුරයෙන් ඉවත් කරනු ලැබීමෙන් හෝ අන්‍යාකාරයකින් ඇති වූ පුරප්පාඩුවක් පිරවීම සඳහා වෙනත් තැනැත්තකු පත් කරනු ලැබූ අවස්ථාවක, එසේ පත් කරනු ලැබූ තැනැත්තා තමා අනුප්‍රාප්ත වන මණ්ඩලයේ සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කොටස තුළ ධුරය දැරිය යුතු ය.

(6) යම් පත් කළ සාමාජිකයකුට, රෝගාතුරවීම හෝ වෙනත් අබලතාවක් හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ නිසා තෙමසකට අඩු නොවන කාලයකට ස්වකීය ධුරයේ කාර්ය ඉටු කිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, ඔහු වෙනුවෙන් වැඩ බැලීම සඳහා, වෙනත් තැනැත්තකු 6 වන වගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගෙන, පත් කරනු ලැබිය හැකි ය.

(7) නිවාඩු නොලැබ මණ්ඩලයේ අනුගාමී රැස්වීම් තුනකට නොපැමිණෙන මණ්ඩලයේ යම් පත් කළ සාමාජිකයකු සිය ධුරය අත්හැර ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

මණ්ඩලයේ සභාපතිවරයා.

8. (1) සභාපතිවරයා විසින් අමාත්‍යවරයා වෙත යවනු ලබන ලිපියක් මගින් ඕනෑම අවස්ථාවක සභාපති ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් කිසිදු හේතුවක් නොදක්වා ඕනෑම අවස්ථාවක සභාපතිවරයා සභාපති ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(3) සභාපතිවරයා රෝගාතුරවීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා ඔහුට ස්වකීය ධුරයේ කාර්ය ඉටු කිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, ඔහු වෙනුවට වැඩ බැලීම සඳහා අමාත්‍යවරයා විසින් මණ්ඩලයේ වෙනත් සාමාජිකයකු පත් කරනු ලැබිය හැකි ය.

(4) (1) සහ (2) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, සභාපතිවරයාගේ ධූර කාලය ඔහු මණ්ඩලයේ සාමාජිකත්වය දරන කාලය විය යුතු ය.

9. (1) සභාපතිවරයා මණ්ඩලයේ සියලුම රැස්වීම්වල මූලාසනය දැරිය යුතු ය. මණ්ඩලයේ යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නැති විටක, පැමිණ සිටින සාමාජිකයන් විසින් තෝරා ගනු ලබන මණ්ඩලයේ සාමාජිකයකු විසින් ඒ රැස්වීම් මූලාසනය දරනු ලැබිය යුතු ය. මණ්ඩලයේ රැස්වීම.

(2) මණ්ඩලයේ යම් රැස්වීමක දී ඡන්ද සමානව දෙපසට බෙදෙන අවස්ථාවක, සභාපතිවරයාට හෝ එම රැස්වීමේ මූලාසනය දරන සාමාජිකයාට ස්වකීය ඡන්දයට අමතරව තීරණ ඡන්දයක් තිබිය යුතු ය.

(3) සභාපතිවරයා විසින් මණ්ඩලයේ රැස්වීම් කැඳවනු ලැබිය යුතු අතර, මේ පනත යටතේ ආයතනයේ කර්තව්‍ය ඉටු කිරීමේ කාර්ය සඳහා අවශ්‍ය වන වාර ගණනක් එම රැස්වීම් පවත්වනු ලැබිය යුතු ය.

(4) මණ්ඩලයේ රැස්වීමක් සඳහා ඒ ගණපූරණය, සාමාජිකයන් පස්දෙනකු විය යුතු ය.

(5) අමාත්‍යවරයා විසින් මුදල් විෂය භාර අමාත්‍යවරයා විමසා තීරණය කරනු ලබන ආකාරයට සහ අනුප්‍රමාණ අනුව, මණ්ඩලයේ සාමාජිකයන්ට පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු ය.

(6) මේ පනතේ විධිවිධානවලට යටත්ව, මණ්ඩලයේ රැස්වීම් පැවැත්වීම සහ එම රැස්වීම්වල කටයුතු කිරීම සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය විධිමත් කිරීම සඳහා වූ නියෝග සාදනු ලැබිය හැකි ය.

(7) මණ්ඩලය විසින් ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී ද, කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීමේ දී ද, අමාත්‍යවරයා විසින් කලින් කල නිකුත් කරනු ලැබිය හැකි විධානවලට යටත් විය යුතු අතර, එම විධානවලට අනුකූලව ක්‍රියා කළ යුතු ය.

යම් පුරප්පාඩුවක් හෝ සාමාජිකයකු පත්කිරීමේ දෝෂයක් තිබීමේ හේතුවෙන් මණ්ඩලයේ රැස්වීම්වල කටයුතු අවලංගු නොවිය යුතු බව.

**10.** 9 වන වගන්තියේ (4) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, මණ්ඩලයේ සාමාජික සංඛ්‍යාවේ යම් පුරප්පාඩුවක් තිබුණ ද ක්‍රියා කිරීමේ බලය මණ්ඩලයට තිබිය යුතු අතර, එවැනි පුරප්පාඩුවක් හෝ මණ්ඩලයේ සාමාජිකයකු පත් කිරීමේ යම් දෝෂයක් හෝ තිබීමේ හේතුව නිසාම පමණක් මණ්ඩලයේ යම් ක්‍රියාවක් හෝ කටයුත්තක් අවලංගු නොවිය යුතු ය.

ආයතනයේ මුද්‍රාව.

**11.** ආයතනයේ මුද්‍රාව –

(අ) මණ්ඩලයේ සභාපතිවරයාගේ භාරයේ තිබිය යුතු ය.

(ආ) මණ්ඩලය විසින් අනුමත කරනු ලැබිය යුතු සැලැස්මකට අනුකූල විය යුතු අතර, මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ආකාරයකට වෙනස් කරනු ලැබිය හැකි ය ; තවද

(ඇ) යම් ලියවිල්ලකට තැබීම, තමන් පැමිණ සිටි බවට සාක්ෂි වශයෙන් ඒ ලියවිල්ලට අත්සන් තැබිය යුතු මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර, නො කරනු ලැබිය යුතු ය.

ආයතනයේ කාර්ය මණ්ඩලය.

**12.** මේ පනතේ විධිවිධානවලට සහ අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝගවලට යටත්ව, ආයතනයේ නිලධරයන් හා සේවකයන් පත් කිරීමේ බලය මණ්ඩලය සතු විය යුතු ය.

ඇතැම් ගිවිසුම්වල කාර්ය සඳහා, ආයතනයට කළ සේවය ආණ්ඩුවට කළ සේවය ලෙස සැලකෙන බව.

**13.** යම් නිශ්චිත කාලසීමාවක් සඳහා ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වෙමින් ආණ්ඩුව සමග ගිවිසුමකට ඇතුළත්ව ඇති යම් තැනැත්තකු ආයතනය විසින් සේවයෙහි නියුක්ත කරනු ලබන අවස්ථාවක, ඒ තැනැත්තා විසින් ආයතනයට කරන ලද යම් සේවා කාලයක්, ඒ ගිවිසුමේ බැඳීම් නිදහස් කිරීමේ කාර්ය සඳහා ආණ්ඩුවට කරන ලද සේවයක් වශයෙන් සලකනු ලැබිය යුතු ය.

ආයතනයේ කාර්ය මණ්ඩලයට රජයේ නිලධරයන් පත්කිරීම.

**14.** (1) මණ්ඩලයේ ඉල්ලීම පිට, අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ සේවය කරන රාජ්‍ය සේවයේ නියුක්ත යම් නිලධරයකු, රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ද එකහත්වය සහිතව දෙනු ලබන අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ කැමැත්ත සහ

ඒ නිලධරයාගේ කැමැත්ත ඇතිව, ආයතනය විසින් එවැනිම කැමැත්ත ඇතිව නිශ්චය කරනු ලබන යම් කාලයක් සඳහා ආයතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය. නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(2) මණ්ඩලයේ ඉල්ලීම පිට, (1) වන උපවගන්තියේ සඳහන් නිලධරයකු නොවන රාජ්‍ය සේවයේ යම් නිලධරයකු, ඒ නිලධරයාගේ ද රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ද කැමැත්ත ඇතිව, එවැනිම කැමැත්ත ඇතිව මණ්ඩලය විසින් තීරණය කරනු ලබන යම් කාලයක් සඳහා ආයතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය ; නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(3) ආයතනයේ කාර්ය මණ්ඩලයට රාජ්‍ය සේවයේ යම් නිලධරයකු තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ රජයේ නිලධරයාට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(4) ආයතනයේ කාර්ය මණ්ඩලයට රාජ්‍ය සේවයේ යම් නිලධරයකු ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ රජයේ නිලධරයාට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

මණ්ඩලයේ බලතල මණ්ඩලයේ සභාපතිවරයාට පැවරීම.

**15** (1) මේ උපවගන්තිය යටතේ වූ මණ්ඩලයේ බලතල හැර, මණ්ඩලයේ බලතල, කාර්ය හෝ කර්තව්‍ය අතුරින් කිසිවක් මණ්ඩලය විසින් මණ්ඩලයේ සභාපතිවරයා වෙත පවරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ මණ්ඩලයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය අතුරින් කිසිවක් පවරනු ලැබ ඇති මණ්ඩලයේ සභාපතිවරයා විසින්, මණ්ඩලයේ විධානයට යටත්ව, එම බලතල ක්‍රියාත්මක කිරීම ද කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීම ද කරනු ලැබිය යුතු ය.

## III වන කොටස

### මුදල්

ආයතනයේ අරමුදල.

16. (1) ආයතනයට ආයතනයේම අරමුදලක් තිබිය යුතු ය.

(2) ආයතනයේ අරමුදලට –

(අ) ආයතනයේ ප්‍රයෝජනය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කල සම්මත කරනු ලබන සියලු මුදල් ;

(ආ) අයතනයේ බලතල, ක්‍රියාත්මක කිරීමේ දී ද කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීමේ දී ද ආයතනයට ලැබෙන සියලු මුදල් ;

(ඇ) ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත කවර හෝ ප්‍රභවයකින් ණය, පරිත්‍යාග, ත්‍යාග හෝ ප්‍රදාන වශයෙන් ආයතනයට ලැබෙන සියලු මුදල් –

බැර කරනු ලැබිය යුතු ය.

(3) ආයතනයේ අරමුදලින් –

(අ) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී හා ඉටුකිරීමේ දී ආයතනය විසින් දරන ලද වියදම් පියවීම සඳහා අවශ්‍ය සියලු මුදල් ;

(ආ) මේ පනතින් හෝ මේ පනත යටතේ හෝ අරමුදලින් ගෙවිය යුතු යයි නියමිත සියලු මුදල්

ගෙවනු ලැබිය යුතු ය.

ආයතනයේ මුදල් වර්ෂය.

17. ආයතනයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

ගිණුම් විගණනය.

18. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ රාජ්‍ය සංස්ථාවක ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් වූ විධිවිධාන, ආයතනයේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

## IV වන කොටස

### පොදු විධිවිධාන

නියෝග.

19. (1) නියෝග සෑදීමට මේ පනතින් නියම කර ඇති හෝ බලය දී ඇති නැතහොත් නියම කළ යුතු යයි මේ පනතින් නියමිත සියලු කාරනා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එය එසේ පළකරනු ලැබූ දිනයේ දී හෝ නියෝගයේ සඳහන් කරනු ලබන යම් පසු දිනයක දී හෝ ක්‍රියාත්මක විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම නියෝගයක්ම, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මනින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ සෑම නියෝගයක්ම, එහි අනනුමතයේ දින සිට, එහෙත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට හානියක් නොමැතිව, පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) යම් නියෝගයක් අවලංගු කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ දැන්වීම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

මේ පනත යටතේ වූ ක්‍රියා සම්බන්ධයෙන් ආරක්ෂාව.

20. (1) (අ) මේ පනත යටතේ ආයතනය විසින් සද්භාවයෙන් කරනු ලබන හෝ කරන ලදයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ආයතනයට විරුද්ධව ; හෝ

(ආ) මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය මත හෝ මණ්ඩලයේ යම් සාමාජිකයකු විසින් හෝ ආයතනයේ නිලධරයකු හෝ සේවකයකු හෝ නියෝජිතයකු විසින් සද්භාවයෙන් කරනු ලබන හෝ කරන ලදයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ සාමාජිකයාට, නිලධරයාට, සේවකයාට හෝ නියෝජිතයාට විරුද්ධව

කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ හෝ ආයතනයේ විධානය මත හෝ කරන ලද හෝ කරන ලදයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව යම් අධිකරණයක් ඉදිරියේ පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී, ඒ ක්‍රියාව කරන ලද්දේ සද්භාවයෙන් යයි අධිකරණය තීරණය කරන්නේ නම්, ඒ නඩුවේ දී ඔහු විසින් දරන ලද යම් වියදම් ආයතනයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

අල්ලස් පනතේ අර්ථානුකූලව ආයතනය උපලේඛනගත ආයතනයක් ලෙස සැලකෙන බව.

21. අල්ලස් පනතේ අර්ථානුකූලව ආයතනය උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගත යුතු ය.

ආයතනයේ නිලධරයන් සහ සේවකයන් රාජ්‍ය සේවකයන් ලෙස සැලකෙන බව.

22. ආයතනයේ සියලුම සාමාජිකයන්, නිලධරයන් හා සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රාජ්‍ය සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

අන්තර්කාලීන විධිවිධාන.

23. (1) 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනත යටතේ පිහිටුවන ලද වෛද්‍ය මධ්‍යස්ථානය වෙත හෝ එම පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය වෙත සතු කරනු ලැබ, එම වෛද්‍ය මධ්‍යස්ථානයේ කාර්ය සඳහා, නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ප්‍රයෝජනයට ගනු ලැබූ සියලු නිශ්චල හා චංචල දේපල නියමිත දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි ආයතනය වෙත සතු විය යුතු ය.

(2) 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනත යටතේ පිහිටුවන ලද වෛද්‍ය මධ්‍යස්ථානයේ කාර්ය සඳහා එම වෛද්‍ය මධ්‍යස්ථානය විසින් හෝ එය සමග නැතහොත් එම පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් හෝ එය සමග ඇති කරගෙන නියමිත දිනට පෙරාතුවම වූ දිනයේ දී බලාත්මකව පවත්නා සියලු ගිවිසුම් සහ එකඟවීම් නියමිත දිනයේ සිට ක්‍රියාත්මක වන සේ, අවස්ථාවෝචිත පරිදි ආයතනය විසින් හෝ එය සමග ඇතිකරගත් ගිවිසුම් සහ එකඟවීම් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව ඒවා බලාත්මක කරනු ලැබිය හැකි ය.

(3) 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනත යටතේ පිහිටුවන ලද වෛද්‍ය මධ්‍යස්ථානයට අදාළව එම පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් හෝ එයට එරෙහිව හෝ පවරනු ලැබ, නියම් දිනට පෙරාතුවම වූ දිනයේ දී විභාග වෙමින් පවත්නා සියලු නඩු, නඩු කටයුතු හා කාරණා, නියමිත දින සිට ක්‍රියාත්මක වන සේ, අවස්ථාවෝචිත පරිදි, ආයතනය විසින් හෝ එයට එරෙහිව හෝ පවරන ලද නඩු, නඩු කටයුතු හා කාරණා ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව දිගටම පවත්වාගෙන යනු ලැබිය හැකි ය.

**24.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

**25.** මේ පනතෙහි පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස –

අර්ථ නිරූපණය.

"මෝටර් වාහනය" යන්නෙහි (203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනතේ ඇති අර්ථය ම තිබිය යුතු ය ;

"පළාත් සභාව" යන්නෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVIIඅ පරිච්ඡේදය මගින් පිහිටුවන ලද පළාත් සභාවක් අදහස් වේ.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.